14 හැවිරිදි පාසල් දැරියකට ලිංගික අතවර කළ බවට චෝදනාවක් යටතේ, ටියුෂන් ගුරුවරයෙකු අත්අඩංගුවට පත් වීමේ සිදුවීමක් සහ, එකොළහ වසරේ ඉගෙනුම ලබන පාසල් දැරියක හා වට්ස්ඇප් පණිවුඩ හුවමාරු කරගැනීම ඔස්සේ ඇයව යම් කිසි වැරදි ක්‍රියාවකට පොළඹවාගැනීමට හෝ අතවරයක් කිරීමට උත්සාහ දැරූ බවට වන චෝදනාව යටතේ පාසැල් ගුරුවරයෙකුට එරෙහිව විමර්ශනයක් කිරීමට කලාප අධ්‍යාපන කාර්යාලයට යොමු කිරීමේ සිදුවීමක්, දිනමිණ පුවත්පත දින දෙකකදී වාර්තා කර තිබිණි. එහිදී, මෙම සිදුවීම් දෙකටම අදාළ ගුරුවරුන්ව පුවත් සිරස්තල තුළ හඳුන්වා දී තිබුණේ "ටියුෂන් ගුරා" සහ "නැටුම් ගුරා" යන යෙදුම් භාවිතා කරමිනි.

1) යම් වරදකට සැකකරුවන් වන ගුරුවරුන් හැඳින්වීමට හෝ "ගුරා" වැනි යෙදුම් මාධ්‍ය තුළ භාවිතා කිරීම කෙතරම් යෝග්‍ය ද?

2) එය සමස්ත ගුරු වෘත්තියම සම්බන්ධයෙන් අපහාසාත්මක ආකල්පයක් සමාජගත කරනු ඇතැයි ඔබ නොසිතන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

